**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2013**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1 ) වගන්තිය සහ 1987 අංක 44 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනතේ 15 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන 2013 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළයුතු අතර, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. එසේ වුවද මණ්ඩලය විසින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ හා ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ මූලධර්ම අනුගමනය නොකිරීම**

මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ ආදායම් වියදම් ගිණුමෙන් ලියාහැර තිබුණු වටිනාකම රු.54,200 ක් වූ ණයගැතියන් හා අත්තිකාරම් ප්‍රවර්තන වර්ෂයේදී ද නැවත ආදායම් වියදම් ගිණුමට බොල් ණය ලෙස ලියා හැරීම නිසා එම වටිනාකමින් ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමුච්චිත අරමුදල් ගිණුමේ ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු.1,333,916 ක ආරම්භක ශේෂය ප්‍රවර්තන වර්ෂයේ දී රු.1,390,322 ක් ලෙස දක්වා තිබූ අතර, අත්තිකාරම් ගිණුමේ ඉකුත් වර්ෂය අවසානයට ශේෂයක් නොපැවතිය දී ආරම්භක ශේෂය රු.53,000 ක් ලෙස දක්වා තිබීම තුළින් ගිණුම්වල තුල්‍යතාවය පිළිබඳ විගණනයේදි ප්‍රශ්නකාරී විය.

(ii) කලා මණ්ඩලය විසින් මුද්‍රණය කරන ලද පිරිවැය රු.68,930 ග්‍රන්ථ 3 ක පිටපත් 230 ක් අලෙවි කර මුදල් එවීමේ පදනම මත බාහිර පොත් ප්‍රකාශකයින් 5 දෙනෙකුට හා සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණද, පිටපත් සඳහා මුදල් ලැබීමක් සිදු වී නොමැති බැවින් තොගයට ගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) තොග ලේඛනය අනුව, මණ්ඩලය විසින් මුද්‍රණය කර තිබුණු ග්‍රන්ථ 3 ක පිටපත් 1039 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරිව තිබුණ ද රු.410,230 ක්වූ එම තොගයේ වටිනාකම අවසන් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. තවද 2011 සහ 2012 වර්ෂවලට අදාළ කලා සහරා පිටපත් 843 ක වටිනාකම වූ රු.73,210 ක් ඉතිරි තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(v) 2005 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන තිබුණු කාර්යමණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා එම වර්ෂයේ සිටම පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයට අදාලව රු.18,955ක් අඩුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 225 (4), 231, 237 (අ) හා 232 (2) | ගෙවීම් වවුචර් පිළියෙල කිරීමේ දී ගෙවීමට අදාළ සියළුම වැදගත් ලියවිලි හා උප වවුචර්, කුවිතාන්සි ඇතුළත් ගොනු සම්බන්ධය වවුචරවල සඳහන් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 264 | ගෙවීම් වවුචර් සඳහා අදාළ මුදල ආදායකයා ලබාගත් බවට කුවිතාන්සි මඟින් තහවුරු කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.164,000 ක් වටිනා ගෙවීම් වවුචර් 3 ක වටිනාකම් ආදායකයා ලබාගත් බවට කුවිතාන්සි මඟින් තහවුරු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (ඇ) | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම එය ලබාගත් කාර්යය නිමවූ වහාම සිදුකළ යුතු වුවද නිලධාරීන් 4 දෙනෙකු විසින් අවස්ථා 10 කදී ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම වලින් ඉතිරිවූ රු.78,985 ක මුදල පියවීම සඳහා දින 11 සිට 71 දක්වා කාලයක් ගතකර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනක සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 751 (1), 753 (1) හා (2) සහ මුදල් රෙගුලාසි 754 | බඩු වට්ටෝරු පොත පොදු 44 ආකෘතිය අනුව විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද භාණ්ඩ ලැබීමේදී මෙන්ම නිකුත් කිරීමේදී මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 754 | විධිවිධාන අනුව බඩු වට්ටෝරු පොත තුලනය කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගර චක්‍රලේඛ අංක 842 | වටිනාකම රු.494,290 ක ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති IAI/ 2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. 133,900 ක පරිගණක සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ආයතන වල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී හඳුන්වා දී තිබෙන, මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵල දැක්වෙන ප්‍රකාශන සකස් කළයුතු ආකෘති අනුව ඒවා පිළියෙල කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ ) අනු මණ්ඩල කමිටු රැස්වීමක් සඳහා අනු මණ්ඩල ලේකම් වෙත රු.750 ක්ද, අනු මණ්ඩල සහකාර ලේකම් වෙත රු.375 ක්ද, කාර්යාල කාර්ය සහායක වෙත රු.200 ක්ද වශයෙන් අනු මණ්ඩල 9 ක් සඳහා එම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂයේ දී රු.80,275 ක් ගෙවීම් කර තිබුණි. ඔවුන් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන්වන බැවින් මේ සඳහා ආයතන සංග්‍රහය හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර ආයතන අධ්‍යක්ෂගේ සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) විධායක මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රවර්තන වර්ෂයේදී රු.695,000 ක පරිත්‍යාග සිදුකර තිබුණි. ඉන් රු.595,000 ක් කලාකරුවන් හා වෙනත් පාර්ශවයන් වෙත මූල්‍යමය ආධාර ලබාදීම සඳහා අවස්ථා 6 කදී වැයකර තිබුණද, කලා මණ්ඩල පනතින් ශ්‍රී ලංකා කලා මණ්ඩලය පිහිටුවීමේ අරමුණු යටතේ පරිත්‍යාග හා ආධාර වශයෙන් මූල්‍යමය අනුග්‍රහයන් දැක්විය හැකි බවට විධිවිධාන සලසා නොතිබුණි. 2013 අයවැය ඇස්තමේන්තුව හෝ ක්‍රියාකාරී සැලැස්මෙන් මේ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද මෙසේ ත්‍යාග හා ආධාර ලබාදීම සඳහා මණ්ඩලය විසින් කිසිදු නිර්ණායකයක්, පදනමක් හෝ ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.241,052 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.465,600 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.224,548 ක වාසිදායක තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ මෙහෙයුම් ආදායම් රු.1,479,770 ක් වැඩිවීමයි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කලා සඟරාව 2013 වර්ෂයේ කලාපය මුද්‍රණය කිරීම සඳහා රු. 500,000 ක් ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන් කර තිබුණද එය මුද්‍රණය කර නොතිබුණි.

(ආ) දේශීය නාට්‍ය කලාවට විශිෂ්ඨ සේවයක් කරන ලද විද්වතුන් දෙදෙනෙකු සම්බන්ධයෙන් අභිනන්දන කලාප 2 ක් මුද්‍රණය කිරීම සඳහා රු.ලක්ෂ 6 ක් ක්‍රියාකාරී සැලැස්ම මඟින් වෙන් කර තිබුණද ඒවා මුද්‍රණය කර නොතිබුණි.

(ඇ) පනතේ 10 (1) උප වගන්තිය අනුව කලා මණ්ඩලයේ රැස්වීම් සෑම තුන් මසකට වරක්ම පැවැත්විය යුතු වුවද 2013 වර්ෂයේදී රැස්වීම් පවත්වා තිබුණේ 2 ක් පමණි.

4.2 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) කලා මණ්ඩල පනතේ විධිවිධාන හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු අනුමත තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ස්ථිර පත්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රධාන විධායක නිලධාරී (ලේකම්) වැඩ බැලීමේ පදනම මත පත්වීම් කර තිබූ අතර, පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු සහ කාර්යාල කාර්ය සහායක යන තනතුරු 2 ක් සඳහා 2005 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවාගෙන තිබුණද තනතුරු 6 න් තනතුරු 02 ක් 2014 මැයි 31 වන විටත් පුරප්පාඩුව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 ඡේදය අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2014 ජුනි 02 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදයේ උපදෙස් පරිදි ආයතනයේ අරමුණු කරා ළඟා විය හැකි වන සේ වර්ෂ 3 කට අදාල වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලස්මක් නොමැතිව 2013 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ සටහන්, වැඩමුළු හෝ ක්‍රියාකාරකම් වල විස්තර, ක්‍රියාකාරකම්වලට අදාළ කාල වකවානු ඇතුළත්ව විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ ) ගිණුම්කරණය
(ආ ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) තොග පාලනය